**<u>සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 02 සේවා ගණය (බදු නිලධාරී) II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය-2021</u>**

සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 02 සේවා ගණය (බදු නිලධාරී) II ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් සබරගමුව පළාතේ පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.2021 මාර්තු මාසයේ දී විභාගය පැවැත්වීමට අපේක්ෂිතය.

01. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව :- 04

02. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය :- 2021.01.15

03. බඳවා ගැනීමේ සුදුසුකම්:-

3.1 අධ්‍යාපන සුදුසුකම්

(අ)විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

හෝ

(ආ) නීතිඥවරයකු වීම.

3.2 පොදු සුදුසුකම්

(අ) **2021.01.15** දිනට අයදුම්කරු සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු වන අතර අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර තුනක් තුළ අයදුම්කරුට සබරගමුව පළාතේ වසර 03 ක ස්ථිර පදිංචිය නොමැති නම් අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.

(ආ) විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.

(ඇ) යම් ආගමික නිකායක පූජකවරයකු වන තැනැත්තෙකුට මෙම විභාගයට පෙනී සිටීමට අවසර නැත.

(ඈ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. **21** ට නොඅඩු සහ **35** ට නොවැඩි විය යුතුය.(උපන් දිනය **1986.01.15** දින හා ඊට පසු -**2000.01.15** දින හා ඊට පෙර)

(ඉ) විවෘත තරඟ විභාගයට අපේක්ෂකයකුට පෙනී සිටිය හැක්කේ දෙවතාවක් පමණි.

04. මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය

අංක 3/2016 හා 2016.02.25 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 02 සේවා ගණය (බදු නිලධාරී) II ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩය MN – 05-2016 වන අතර මාසික වැටුප් පරිමාණය රු:34,605-10X660-11X755-15X930-රු 63460/- වේ. මෙයට අමතරව රජයේ නිලධාරීන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

05. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

06. බඳවා ගැනීමේ ක්‍රමය:-

පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇති විට ලිඛිත තරඟ විභාගයක ප්‍රතිඵල මත විෂයයන් තුනම සමත් අයදුම්කරුවන් , රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 විධිවිධාන පරිදි ඉහළම කුසලතා අනුපිළිවෙල අනුව දිස්ත්‍රික් ජන අනුපාතය මත හා දිස්ත්‍රික් කුසලතා පදනම් කරගනිමින් පවතින පුරප්පාඩු ගණනට සමාන පිරිසක් බඳවා ගැනීම සිදු කරනු ලැබේ. සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40 % කි.

07. විභාගයේ විෂය නිර්දේශය:-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 1.අවබෝධය | I වැනි කොටස<br>රචනයක් හා සාරාංශයක් ලිවීම ඇතුළත් වේ.<br><br>II වැනි කොටස<br>භාෂාව පිළිබඳ වැටහීම පරීක්ෂා කිරීම පිණිස සැකසුණු පාඨයන් කිහිපයකින් දෙවැනි කොටස සමන්විත වේ.මෙම පාඨයන් ආශ්‍රයෙන් යටින් ඉරි ඇඳි පදයන්ගේ අර්ථය තනි වාක්‍යයකින් ප්‍රකාශ කරන ලෙස හෝ ඒ පිළිබඳ විචාරාත්මක සටහන් ලියා දක්වන ලෙස හෝ විකල්පයන් කාණ්ඩයකින් ඉතාමත්ම උචිත ප්‍රකාශය තෝරා දක්වන ලෙස හෝ දී ඇති ප්‍රශ්නය සඳහා පිළිතුරු කිහිපයක් අතරින් නිවැරදි පිළිතුර තෝරා දක්වන ලෙස නියම කරනු ලැබේ. | පැය 02 | 100 | 40 |
| 2.බුද්ධි පරීක්ෂණය | තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදි සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ.(මෙය බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.) | පැය 01 | 100 | 40 |
| 3.සාමාන්‍ය දැනීම | ශ්‍රිලංකාවේභූගෝලීය,දේශපාලනික,ආර්ථික,සමාජී ය සහ සංස්කෘතික පරිසරය ඇතුළුව ශ්‍රී ලංකාවේ මුළු පරිසරය පිළිබඳව සහ අන්තර් ජාතික වශයෙන් වැදගත් වන්නා වූ කාලීන තත්වයන් මෙන්ම විද්‍යාත්මක සහ තාක්ෂණ වර්ධනයන් පිළිබඳව දැනීම දැනීම මෙමගින් පරීක්ෂා කරනු ලැබේ.(බහුවරණ ප්‍රශ්න පත්‍රයකි) | පැය 01 | 100 | 40 |

මෙම විභාගය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් සිංහල හා දෙමළ භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ.ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අනුව විභාගය පවත්වන නගරය තීරණය කරනු ලැබේ.විභාගයේදී අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ.පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රමාණවත් අයදුම්පත්‍ර සංඛ්‍යාවක් නොලැබුනහොත් විභාගයක් පැවැත්වීම ගැන සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

## 08. අයදුම්කිරීමේ ක්‍රමය

8.1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව ඒ-4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් අනු අංක 01 සිට 03තෙක් ඡේදයන් පළමුවන පිටුවටද අංක 04 සිට 06 තෙක් දෙවන හා තුන්වන පිටුවට ද වශයෙන් ඇතුළත් වන සේ පිළියෙල කරගත් අයදුම්පත්‍රය තම අත්අකුරින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.2. විභාග ගාස්තුව රු. **1000/-** කි. **මෙම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ 20.03.02.99 දරන ආදායම් ශීර්ෂයට බැරවන ලෙස** සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/ දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදාල කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුවේ. (කුවිතාන්සියේ ඡායා පිටපතක් මිතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) ගෙවන ලද විභාග ගාස්තුව කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ. ඉහත සඳහන් ආයතන වලට හැර වෙනත් කාර්යාලවලට (තැපැල් කාර්යාල, බැංකු) මුදල් ගෙවන ලද කුවිතාන්සි භාරගනු නොලැබේ.

8.3. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2021.01.15** දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් **ලේකම්, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, නවනගරය, රත්නපුර** යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත/කාර්යාලගත ඛණ්ඩ 02 සේවා ගණය(බදු නිලධාරි) II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය-2021"** යනුවෙන් සඳහන් කළයුතුය. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්, තනතුරට අදාල සුදුසුකම් සපුරා නොමැති සහ අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.4. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනයට අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වේනම් ඒ පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වන්නේය.මෙහි සිංහල හා දෙමළ නිවේදන අතර **කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍යය නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.** එසේම මෙම බඳවා ගැනීමේ නිවේදනය අනුව පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීම මෙම කොමිෂන් සභාව සතුවේ.

පී.එස්.ආර්.එම්.විජයරත්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
2020.12.09

# ආදර්ශ අයදුම්පත්‍රය

**සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 02 සේවා ගණය (බදු නිලධාරි) II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය-2021**

---

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(අදාල අංකය කොටුව තුළ ලියන්න ) [ ]
සිංහල - 1
දෙමළ - 2

විභාගයට පෙනීසිටීමට කැමති නගරය
රත්නපුර [ ]
කෑගල්ල [ ]

01. අ. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :-.......................................................................
..............................................................................................................
..............................................................................................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදා : GUNAWARDHANA, M.G.B.S.K.)

ආ. සම්පූර්ණ නම:-...........................................................................................
..............................................................................................................
( සිංහලෙන් / දෙමළෙන්)

ඇ. සම්පූර්ණ නම :-...........................................................................................
..............................................................................................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

ඈ. ජාතික හැඳුනුම්පත් අංකය:- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

ඉ. දුරකථන අංකය:- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

02. I. ස්ථිර ලිපිනය :-...........................................................................
...........................................................................

II විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය-..............................................................
..............................................................................

III. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- රත්නපුර [ ] කෑගල්ල [ ]

IV. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන 2021.01.15 දිනට සබරගමුව පළාතේ ස්ථිර පදිංචි කාල සීමාව

අවුරුදු [ ] මාස [ ] දින [ ]

ඔබ සබරගමුව පළාතේ පදිංචි කරුවකු නොවේ නම් කලත්‍රයා සබරගමුව පළාතේ පදිංචි අයකුදැයි සඳහන් කරන්න..............................................................................................

03. I. ස්ත්‍රී/ පුරුෂ භාවය :- [ ]
ස්ත්‍රී-1, පුරුෂ-0
(අදාල අංකය කොටුව තුළ ලියන්න.)

II. උපන්දිනය :- වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2021.01.15 දිනට වයස :-
අවුරුදු [ ] මාස [ ] දින [ ]

04. අධ්‍යාපන සුදුසුකම්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධි පිළිබඳ විස්තර

| විශ්ව විද්‍යාලය | හදාරා ඇති උපාධිය | කාලසීමාව | සාමාර්ථය | වලංගු දිනය (Effective date) |
|---|---|---|---|---|
| | | | | |

(මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.උපාධි සහතිකයේ හෝ උපාධිය සමත් බවට විශ්ව විද්‍යාලයෙන් ලබා දෙන සනාථන ලිපියේ ඡායා පිටපතක් ද අමුණන්න)

නීතිඥයකු නම්
නීතිඥයකු ලෙස දිවුරුම් දුන් වර්ෂය -.............................
(එම සහතිකයේ ඡායාපිටපතක් අමුණන්න. )

05. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :- ......................................
විභාග ගාස්තු ගෙවූ කාර්යාලය:-.................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
*( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

06. අයදුම්කරුගේ සහතිකය

..........................................................වන මා විසින් මෙම අයදුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යයි සොයාගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම් කර ඇති ඉහත තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය:-

.........................................
අයදුම්කරුගේ අත්සන

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**
**( අනවශ්‍ය වචන කපා හරින්න )**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ......................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ................................. දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම:-

අත්සන :-.............................................................
තනතුර හා නිල මුද්‍රාව

(මෙම සහතිකය රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, රු.240,360/- වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.)

**රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා**
**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ( අනවශ්‍ය වචන කපා හරින්න )**

......................................................................................මයා/මිය/මෙනවිය දැනට ..................................................
අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ..................................................... වශයෙන් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ යෙදී සිටින බවත්, ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරණ තනතුරින් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි.

දිනය :-

.......................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
( නිල මුද්‍රාව තබන්න)